සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# කතෝලික ධර්මය

10 ශ්‍රේණිය | කාලය පැය 3 යි.

නම/ විභාග අංකය:

## I - කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෙන්තකොස්ත යන්නෙහි අර්ථය,
(1) අස්වැන්න නෙළීම (2) පනහ (3) නාඹුල් එළ (4) තුති පිදීම

02. පුරාණ ගිවිසුමෙහි ඇති දිවැසිවර ග්‍රන්ථ,
(1) 5 කි. (2) 16 කි. (3) 17 කි. (4) 7 කි.

03. ශු. සභාවේ පළමු ප්‍රාණපරිත්‍යාගිවරයා,
(1) මහා ජාකොබ් (2) පේදුරුතුමා (3) ජුවාම්තුමා (4) ස්තේපන්

04. අතිඋතුම් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ උපන් රට,
(1) පෝලන්තය (2) නිව්යෝක් (3) ආර්ජන්ටිනා (4) ඉතාලිය

05. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස්,
(1) 1 (2) 2 (3) 3 (4) 4

06. ශුද්ධ මැක්ෂිමිලියන් කොල්බේ මුනිතුමා උපත ලැබූ වර්ෂය,
(1) 1501 (2) 1894 (3) 1794 (4) 1891

07. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග,
(1) 4 කි. (2) 3 කි. (3) 5 කි. (4) 7 කි.

08. කතෝලික සභාව පිළිගත් සභා ගණන,
(1) 10 කි. (2) 2 කි. (3) 4 කි. (4) 7 කි.

09. ශුද්ධ වූ පාවුලු තුමා ................................ ගෝත්‍රයට අයත් වූවෙකි.
(1) බෙන්ජමින් (2) ගමාලියෙල් (3) ජුදා (4) හේබ්‍රෙව්

10. ජනවන්දනාවේ ප්‍රධාන අංග ................................ කි.
(1) 3 (2) 7 (3) 12 (4) 4

11. ශුද්ධ වූ පාවුලු තුමාගේ ලිපියකි,
(1) හේබ්‍රෙව් (2) පේදුරු (3) ගලාති (4) ජාකොබ්

12. ලන්දේසි මෙරටට පැමිණියේ,
(1) ක්‍රි.පූ. 1658 දී (2) ක්‍රි.ව. 1653 දී (3) ක්‍රි.ව. 1505 දී (4) ක්‍රි.ව. 2000 දී

13. ශ්‍රී ලංකාවේ ඇති පදවි ගණන වන්නේ,
(1) 10 කි. (2) 15 කි. (3) 5 කි. (4) 12 කි.

14. දිව්‍ය පූජාවේ පිළිවෙත් ගණන වන්නේ,
(1) 10 කි. (2) 6 කි. (3) 5 කි. (4) 12 කි.

15. ''ලාඕස්'' යන වචනයෙන් හඳුන්වන්නේ,
(1) ජනතාවයි. (2) එඬේරුයි. (3) පියතුමා. (4) ජනවන්දනාව.

16. ජනවන්දනාවේ ප්‍රධාන අංගයක් නොවන්නේ,

(1) දිව්‍ය පූජාව (2) දේව ප්‍රසාද නිධාන (3) යාම යැදුම (4) විශ්වාස ලක්ෂණය

17. සත්‍යයට සාක්ෂි දැරීම නිසා ශුද්ධවරයට ඔසවනු ලැබුයේ,

(1) තෙරේසා මව්තුමිය (2) මැක්ෂිමිලියම් කෝල්බේ මුනිතුමා

(3) කැරොල් වෙයිට්ල්ලා තුමා (4) ජුසේවාස් පියතුමා

18. ශ්‍රී ලංකාවේ දී භාග්‍යවරයට ඔසවනු ලැබුයේ,

(1) ගොන්සාල්වේස් පියතුමා (2) අසීසියේ ප්‍රැන්සිස් තුමා

(3) ජුසේවාස් පියතුමා (4) ශුද්ධ වූ ජුසේ තුමා

19. තම සේවය මව් රටේ දී මෙන්ම ශ්‍රී ලංකාවේදී ද ජනතාවට උපරිම ලෙස ලබා දුන් පුද්ගලයන් දෙදෙනෙකු වන්නේ,

(1) ජුසේවාස් පියතුමා සහ ගොන්සාල්වේස් පියතුමා

(2) ජුසේවාස් පියතුමා සහ මයිකල් රුද්‍රිගෝ පියතුමා

(3) ගොන්සාල්වේස් පියතුමා සහ මයිකල් රුද්‍රිගෝ පියතුමා

(4) ජුසේවාස් පියතුමා සහ තෝමස් කුරේ කාදිනල් තුමා

20. පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය සඳහන් කර ඇත්තේ,

(1) පැරණි ගිවිසුමේය. (2) ශුද්ධවර මාක් සුවිශේෂයේ ය.

(3) පාවුලු තුමාගේ ලිපිවලය. (4) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතේය.

21. පොදු පූජකවරය තුළ අප ලබන ත්‍රිවිධ කැඳවීම වන්නේ,

(1) දිවැසි, පූජක, නායක (2) දිවැසි, පූජක, රාජකීය

(3) පූජක, නායක, රාජකීය (4) නායක, රාජකීය, දිවැසි

22. ප්‍රසාද නිධාන වලින් අප ආත්මයේ නොමැකෙන ලාංඡනයක් ඇති කරන්නේ,

(1) අභිවෘද්ධි ආලේපනය (2) ආශිර්වාදකාර බන්ධනය

(3) සමගි සන්දානය (4) රෝගීන්ගේ ආලේපනය

23. දිව්‍ය පූජාවේ පිළිතුරු ගීය අප උපුටා ගයන්නේ,

(1) හිතෝපදේශයෙනි (2) ක්‍රියාපොතෙනි (3) ගීතාවලියෙනි (4) එළිදරව්වෙනි

24. ඔබගේ පියා හා මව විවාහ වූ දිනයේ දී ඇතුලත් වූ බන්ධනය තුළ,

(1) වාසනාවන්ත දිවියක් ගත කරයි. (2) සදාතනික ප්‍රේමයට ඇතුලත් වෙයි.

(3) දරුවන් රැකබලා ගනියි. (4) සියල්ල ඉවසීමෙන් දරා ගනියි.

25. පැරණි ගිවිසුමේ දස පනත ගල් පුවරුවල ලියනු ලැබුවද නව ගිවිසුමේ පනත් ලියන ලද්දේ,

(1) පොතකය. (2) ගල් පර්වතවලය. (3) පැපිරස්වලය. (4) මිනිස් සිතෙහිය.

26. තෙරේසා මව්තුමිය තම දිවිය කැප කළ මුල්ම නිකාය කුමක් ද?

(1) මිෂනරි ඔෆ් ද චැරිටි (2) ෆ්‍රැන්සිස්කන් නිකාය (3) ලොරෙට්ටෝ නිකාය (4) ජපමාල නිකාය

27. කෝල්බේ මුනිතුමා ආරම්භ කළ සංවිධානය වන්නේ,

(1) මරියතුමියගේ ශ්‍රී හෘදයේ හමුදාව (2) ගැලවීමේ හමුදාව

(3) මරිය හමුදාව (4) වින්සන්ද පාවුලා සමිතිය

28. විවාහ බන්ධනය ස්ථාපිත කරනු ලැබුයේ,

(1) ක්‍රිස්තුන් වහන්සේය (2) මැවුම්කරුය (3) විවාහ වන යුවලය (4) පූජාප්‍රසාදිතුමාය

29. හය සහ නවය යන පනත් වලින් අපට වැළකී සිටීමට නියම වන්නේ,

(1) තම වයසට නොගැලපෙන ඇඳුම් පැළඳුම් ඇඳීමෙනි.

(2) අසභ්‍ය වචන කතා කිරීම හා බොරු කීමෙනි.

(3) අසභ්‍ය පොත්පත් හා සියලු දේ ආශ්‍රයෙනි.

(4) සිත, කය හා වචනයට විරුද්ධව මෙහෙයවා කරන ක්‍රියාවලිනි.

30. මිනිසා තුළ පවතින දේව සමානකමේ ලක්‍ෂණයකි,

(1) බුද්ධිය (2) ක්‍රියාශීලීබව (3) සමානාත්මතාව (4) පාපයෙන් මිදීම

31. ජනතා සේවයේ ප්‍රසාද නිධාන යනු,

(1) පූජාත්වරය හා ප්‍රසාද ස්නාපනය (2) පූජාත්වරය හා දිව්‍ය සත්ප්‍රසාදය

(3) පූජාත්වරය හා ආශිර්වාදකාර බන්ධනය (4) පූජාත්වරය හා සමගි සන්ධානය

32. දේව අනාවරණයේ සුල මුල වනුයේ,

(1) විශ්වාසයයි. (2) බලාපොරොත්තුවයි. (3) දේවානුභාවයයි. (4) ප්‍රේමයයි.

33. දරුවන්ගේ මුල්ම ගුරුවරුන් වන්නේ,

(1) පඬිවරුන්ය. (2) එඬේරුන්ය. (3) දෙමාපියන්ය. (4) නායකයන්ය.

34. ශෝක වන්නෝ භාග්‍යවන්තයෝ ය. ඔවුහු .........................

(1) දේශය උරුම කර ගන්නෝය. (2) තෘප්තිමත් වන්නෝය.

(3) දයාව ලබන්නෝය. (4) සැනසීම ලබන්නෝය.

35. සභාවේ වැඩිහිටි බව ලබන්නේ,

(1) සමගි සන්ධනාය තුළිනි. (2) අභිවෘද්ධි ආලේපය තුළිනි.

(3) ආශිර්වාදකාර බන්ධනය තුළිනි. (4) පූජකවරය තුළිනි.

36. නව ගිවිසුම තුළ සිය විශ්වාසය ප්‍රායෝගිකව ප්‍රකාශ කළ කාන්තාව වන්නේ,

(1) මහලේ රෝගී වූ ස්ත්‍රීය (2) කුදු ස්ත්‍රීය

(3) ජයිරස්ගේ දියණිය (4) කායිම් නුවර වැන්දඹුව

37. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයේ ජීවිතයට අප පංගුකාරයන් වන්නේ,

(1) අභිවෘද්ධි ආලේපය ලබාගත් විටය. (2) දිව්‍ය සත්ප්‍රසාදය ලබාගත් විටය.

(3) ප්‍රසාද ස්නාපනය ලබාගත් විටය. (4) පාපොච්චාරණය කරන විටය.

38. උත්තම පූජක යාච්ඤාවේ සඳහන්ව ඇති සුභාරංචිය වන්නේ,

(1) ශුද්ධ වූ මාක් තුමාගේ සුභාරංචිය (2) ශුද්ධ වූ මතෙව් තුමාගේ සුභාරංචිය

(3) ශුද්ධ වූ ලූක් තුමාගේ සුභාරංචිය (4) ශුද්ධ වූ ජොහාන් තුමාගේ සුභාරංචිය

39. උත්තම පූජක යාච්ඤාව හඳුන්වන වෙනත් නමක් වන්නේ,

(1) ස්වාමිවාක් ආරාධනාව (2) ශ්‍රාවකයින් සඳහා යැදුම

(3) විශ්වාස ලක්‍ෂණය (4) දයාධික මනස්ථාපය

40. පඬුරු පිදීමේ පරමාර්ථ ගණන වන්නේ කීයද?

(1) තුනකි. (2) හතරකි. (3) දෙකකි. (4) පහකි.

The National e-learning Portal for The General Education

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) (1) පස්වන දේව පනත නම් කරන්න.

(2) ජන වන්දනාවේ ප්‍රධාන අංග 03 නම් කරන්න.

(3) පාස්කු අභිරහස යනු කුමක් ?

(4) ශුද්ධ වූ සතියට අයත් ප්‍රධාන දවස් නම් කරන්න.

(5) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 02 නම් කරන්න.

(6) කිතුතුමා අන්තිම රාත්‍රි භෝජනයේදී කළ කාර්යයන් 02 ක් නම් කරන්න.

(7) එලිදරව් සාහිත්‍යයේ ලක්ෂණ 02 ක් නම් කරන්න.

(8) ප්‍රසාද ස්නාපනයෙන් ලබන වරප්‍රසාද 02 ක් ලියන්න.

(9) පස්වන පනතට විරුද්ධව කරන පාපි 02 ක් නම් කරන්න.

(10) ජනවන්දනාවේ හදවත වන්නේ කුමක් ද?

(02) (1) අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ ජේසුස් වහන්සේ පූපය අතට ගෙන තුති පුදා පැවසූ වදන් පෙළ ලියන්න.

(2) ජේසුස් වහන්සේ මෙන් අන් අය වෙනුවෙන් ජීවිතය පවරා දීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න.

(03) (1) දිව්‍ය පූජාව ගැන ඔබට හැඟෙන දේ ලියන්න.

(2) දිව්‍ය පූජාවේ පිළිවෙත් තුනක් නම් කරන්න.

(3) ඉරුදින දිව්‍ය පූජාවට නොයන මිතුරකුට / මිතුරියකට ඔබ දෙන උපදෙස් මොනවා ද? හතරක් ලියන්න.

(04) (1) ජන වන්දනාව යනු කුමක් ද?

(2) ජන වන්දනාවේ කාල පරිච්ඡේද නම් කරන්න.

(3) ඉන් එක් කාල පරිච්ඡේදයක් ගැන කෙටියෙන් හඳුන්වන්න.

(05) (1) යාච්ඤාවේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න.

(2) යාච්ඤාවේ කැපී පෙනෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න.

(3) ඔබගේ විභාගයේ ප්‍රතිඵල ලැබුණු පසු ඔබ දෙවි පියාණන්ට කරන ස්තුති කිරීමේ යාච්ඤාවක් ලියන්න.

(06) පහත සඳහන් මාතෘකා 02 ක් තෝරාගෙන පේළි 12 කට නොඅඩුවන සේ කෙටි සටහන් ලියන්න.

(1) ජනවන්දනා වර්ෂය

(2) ශුද්ධ වූ මරිය ගොරෙත්තිතුමිය

(3) හතරවන දේව පනත

(4) දිව්‍ය සත්ප්‍රසාදය

The National e-learning Portal for The General Education